විශාඛා විද්‍යාලය, කොළඹ 5

**ආර්ථික විද්‍යාව - II පත්‍රය**

**13 වසර - 1 වාරය**

(කාලය - පැය 03)

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන උපරිම ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

**"අ" කොටස**

(1) එක්තරා ආර්ථිකයක 2000 සිට 2010 දක්වා කාලය තුළ නිෂ්පාදන ධාරිතාව 25% කින් වර්ධනය වූ බව වාර්තා විය.

i) මෙම තත්ත්වය කල්පිත සංඛ්‍යා ඇතුළත් නිෂ්පාදන හැකියා මායිම් රූපසටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ල. 04)

ii) කිසියම් ආර්ථිකයක X හා Y යන භාණ්ඩ වර්ග දෙක නිෂ්පාදනය කිරීමේ දී ආවස්ථික පිරිවැය හැසිරෙන ආකාරය පහත සමීකරණයෙන් දැක්වේ.

$$X = 150 - 2Y$$

අ) ඉහත සමීකරණය පදනම් කරගනිමින් X හා Y භාණ්ඩ දෙක සඳහා නිෂ්පාදන හැකියාව පෙන්නුම් කරන ලේඛනයක් පිළියෙල කර, සිරස් අක්ෂයෙන් X භාණ්ඩයත් තිරස් අක්ෂයෙන් Y භාණ්ඩයත් පෙන්නුම් කෙරෙන පරිදි හැකියා මායිම නිර්මාණය කර A, B, C වශයෙන් නිමැවුම් සංයෝග ලකුණු කරන්න. (ල. 04)

ආ) X හා Y භාණ්ඩ සමාන ප්‍රමාණයන්ගෙන් නිපදවිය හැකි අවස්ථාවක් මෙහි පවතීද? ඒ කවර [illegible] (ල. 02)

ඇ) X භාණ්ඩයෙන් 100 හා Y භාණ්ඩයෙන් 50 ක් මෙම ආර්ථිකයට අවශ්‍ය වේ නම් එය නිපදවීමේ හැකියාවක් මේ ආර්ථිකයට පවතීද? එසේ නොපවතී නම් මේ ආර්ථිකය ගත යුතු ක්‍රියාමාර්ගය කුමක්දැයි පැහැදිලි කරන්න. (ල. 04)

ඈ) මෙම සමීකරණය X = 300 - 2Y ලෙස වෙනස් වූයේ නම් නිෂ්පාදන හැකියාවේ සිදුවන වෙනස රූපසටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ල. 02)

iii) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව අතර වෙනස පහදන්න. (ල. 04)

(2) i) "තෝරා ගැනීමේ ගැටළුව ආර්ථික පද්ධති බිහිවීමේ මූලික පදනමයි" විමසන්න.

ii) වෙළඳපල ආර්ථික පද්ධතියක් සැලසුම්ගත ආර්ථික පද්ධතියකින් වෙනස් වන්නේ කෙසේද?

iii) මධ්‍ය සැලසුම් අධිකාරිය මගින් සකසනු ලබන ආර්ථික සැලැස්මක් යන්නෙන් කුමක් අදහස් වේද? එහි මූලික අරමුණු මොනවාද?

iv) ශ්‍රී ලංකාවේ ආර්ථිකය මිශ්‍ර ආර්ථිකයක් යැයි ඔබ සලකන්නේ ද? එසේ නම් උදාහරණ දක්වමින් සනාථ කරන්න.

(ල. 5 x 4 = 20)

(3) සීනි වෙළඳපලක ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

$$Qd = 120 - 2p$$

$$Qs = -40 + 2p$$

i) සීනි සඳහා වන වෙළඳපල සමතුලිත මිල හා ප්‍රමාණය ඉල්ලුම් සැපයුම් ලේඛනයක් හා ඉල්ලුම් සැපයුම් වක්‍ර මගින් පෙන්නුම් කරන්න.

(ල. 04)

ii) සීනි 1Kg ක් සඳහා රු. 20/- බැගින් වූ සහනාධාරයක් ලබාදුන්නේ නම් නව සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණ ද?

(ල. 04)

iii) සහනාධාරය නිසා ශුභසාධනයට වන බලපෑම පහත සඳහන් වගුවට අනුව ගණනය කර දක්වන්න (අගය 0 නම් ශුන්‍ය ලෙස දක්වන්න)

| | සහනාධාරයේ බලපෑමට හසුවන ක්ෂේත්‍රයන් | සහනාධාරයට පෙර | සහනාධාරයට පසු |
|---|---|---|---|
| 1 | පාරිභෝගික අතිරික්තය | | |
| 2 | නිෂ්පාදන අතිරික්තය | | |
| 3 | සහනාධාරය සඳහා රජයේ වියදම | | |
| 4 | සමාජ සුභසාධනය | | |
| 5 | අහිමි වන සුභසාධනය | | |

(ල. 2 x 5 = 10)

iv) "නිෂ්පාදන සහනාධාරයක් හැම විටම සමාජ ශුභසාධනයට හිතකර වේ" යන ප්‍රකාශයට එකඟ විය හැකිද? පහදන්න.

(ල. 02)

(4) i) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය අතර වෙනස පැහැදිලි කරන්න.

ii) කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය ඇතුළත් රූප සටහනක් ඇඳ එම පිරිවැය වක්‍රවල දැකිය හැකි විශේෂ ලක්ෂණ ලියා දක්වන්න.

iii) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයෙහි හැසිරීම දැක්වෙන රූප සටහනක් ඇඳ එම පිරිවැය පහත වැටීමට බලපාන හේතු මොනවාදැයි සැකවින් පහදන්න.

iv) පූර්ණ තරඟකාරී වෙළඳපලක් සහ ඒකාධිකාරී තරඟ වෙළඳපලක් අතර ඇති වෙනස්කම් මොනවාද? උදාහරණ සහිතව පහදන්න.

(ල. 5 x 4 = 20)

## "ආ" කොටස

(5) i) "ජාතික ගිණුම්කරණය" යන්න හඳුන්වා එහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

ii) නිමැවුම, ආදායම හා වියදම යන ප්‍රවේශයන් ත්‍රිත්වයෙන්ම සමාන වූ අගයක් ජාතික නිමැවුමේ වටිනාකම ලෙස ලැබීමට හේතු දක්වන්න.

iii) සමාහාර ඉල්ලුම අනපේක්ෂිත තොග වෙනස් වීම හා නිමැවුමේ සිදුවන වෙනස්වීම අතර ඇති සම්බන්ධතාවය රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

iv) "ප්‍රාග්ධන ක්ෂය සඳහා වෙන් කිරීම" නිමැවුම් ආදායම [redacted] තුළ ගලපනු ලබන්නේ කෙසේද?

v) පහත අයිතම අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.

අ) දේශීය ආදායම හා විදේශීය ශුද්ධ සාධක ආදායම

ආ) සාධක මිල හා වෙළඳ මිල

ඇ) කුටුම්භ ආදායම හා වැය කළ හැකි කුටුම්භ ආදායම

ඈ) දළ දේශීය නිෂ්පාදිතය හා දළ ජාතික නිෂ්පාදිතය

(ල. 4 x 5 = 20)

(6) i) පහත දැක්වෙනුයේ රාජ්‍ය අංශයක් පවතින සංවෘත ආර්ථිකයක සමාහාර ඉල්ලුම පිළිබඳ තොරතුරුය.

(රුපියල් බිලියන)

$S = -400 + 0.25\,yd$

$I = 1000$

$G = 400$

$T = 400$

අ) මෙම ආර්ථිකයේ සමාහාර ඉල්ලුම් ශ්‍රිතය සොයා එය රූප සටහනකින් දක්වන්න. (ල. 02)

ආ) මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුමේ වටිනාකම කොපමණද? එය සොයා ඉහත දැක්වූ සමාහාර ඉල්ලුම් ශ්‍රිතය මත සුදුසු ආකාරයකින් එය නිරූපණය කරන්න. (ල. 03)

ඇ) පහත එක් එක් අවස්ථාවල දී සමතුලිත ආදායම කෙසේ, කුමන ප්‍රමාණවලින් වෙනස් වේද යන්න වෙන වෙනම ගණනය කරන්න.

i. රාජ්‍ය වියදම රුපියල් බිලියන 100 කින් ඉහළ දැමීම. (ල. 02)

ii. ස්වායත්ත බදු රුපියල් බිලියන 100 කින් ඉහළ දැමීම. (ල. 02)

iii. රාජ්‍ය වියදම රුපියල් බිලියන 100 කින් හා ස්වායත්ත බදු රුපියල් බිලියන 100 කින් ඉහළ දැමීම. (ල. 02)

ඇ) ඉහත (ආ) හා ඔබ විසින් ගණනය කරන ලද පිළිතුරට අනුරූපව ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම රුපියල් බිලියන 6500 ක් නම් මෙම තත්ත්වය ඔබ හඳුන්වන්නේ කවර නමකින්ද? එය එම රූප සටහන මත දක්වන්න. (ල. 03)

ii) පහත දැක්වෙනුයේ විවෘත ආර්ථිකයක සමතුලිත තත්ත්වය පිළිබඳ වූ තොරතුරුය.

(රුපියල් බිලියන)

| | | |
|---|---|---|
| ඉතුරුම් ආයෝජන පරතරය | = | 700 |
| රජයේ බදු ආදායම | = | 600 |
| රාජ්‍ය අයවැය හිඟය | = | 300 |
| දළදේශීය ආයෝජන වියදම | = | 800 |
| ආනයන වියදම | = | 100 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

අ) ඉතුරුම්

ආ) රාජ්‍ය වියදම

ඇ) ශුද්ධ අපනයන (ල. 06)

(7) i) පහත සංකල්ප කෙටියෙන් විස්තර කරන්න.

අ) උද්ධමනය

ආ) අවධමනය

ඇ) මතුපිට උද්ධමනය

ඈ) මූලික / යටදැරි උද්ධමනය

ii) උද්ධමනය විග්‍රහකරන ප්‍රවේශයක් ලෙස මුදල් ප්‍රමාණවාදය විග්‍රහ කරන්න.

iii) "උද්ධමනයක් ඇතිවන්නේ ඉල්ලුම් පාර්ශවයෙන් පමණි" යන ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

iv) "උද්ධමනයෙන් පීඩාවට පත්වන්නන් මෙන්ම ප්‍රතිලාභ ලබන්නන්ද සිටී" මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න.

v) ජීවන වියදම මැනීමේ මිනුමක් ලෙස කොළඹ පාරිභෝගික මිල දර්ශකය පිළිබඳ ඇගයීමක් කරන්න. (ල. 4 x 5 = 20)

(8) i) වර්තමාකමේ සන්නිධියක් ලෙස මුදලේ කාර්ය මුදල් ඉල්ලුම හා සම්බන්ධ වන්නේ කෙසේදැයි පහදන්න. (ල. 04)

ii) පටු මුදල් සැපයුම හා පුළුල් මුදල් සැපයුම යන සංකල්ප විස්තර කරන්න. (ල. 04)

iii) මූල්‍ය ප්‍රතිපත්ති යාන්ත්‍රණය පැහැදිලි කරන්න. (ල. 04)

iv) බැංකු පද්ධතියේ ඒකාබද්ධ ශේෂ පත්‍රය පහත පරිදිය.

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| තැන්පතු | 4000 | සංචිත | 800 |
| | | ණය | 3200 |
| | 4000 | | 4000 |

මහජනයා සතු ව්‍යවහාර මුදල් 4200 ක් වූ අතර, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය 10% කි.

අ) බැංකු පද්ධතියේ අධිසංචිත ශූන්‍ය වන තෙක්ම ණය සැපයූ විට බැංකු පද්ධතියේ ඒකාබද්ධ ශේෂ පත්‍රය දක්වන්න. (ල. 04)

ආ) අධිසංචිත ශූන්‍ය වන තෙක් ණය ප්‍රසාරණය කළ පසු නව පටු මුදල් සැපයුම කොපමණද? (ල. 02)

ඇ) මහජනයා සතු රු. 200/- ක් බැංකු පද්ධතියේ තැන්පත් කළ පසු බැංකු පද්ධතියේ අධිසංචිත පවත්වා නොගන්නා බවත්, බැංකු පද්ධතිය අධිසංචිත ශූන්‍ය වන තෙක් ණය ප්‍රසාරණය කළහොත් බැංකු පද්ධතියේ මුළු තැන්පත් ප්‍රමාණය දක්වන්න. (ල. 02)